# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,979 - 2016 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2016.08.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 954 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනත් කෙටුම්පත 2016 මැයි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අගෝස්තු 26 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අගෝස්තු මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 ජූනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන සහ සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය.

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රීලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

නඩු අංකය : CH (Civil)
557/2011/MR
වටිනාකම : රු. 5,000,000
ස්වභාවය : උකස් බැඳුම්කර
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

*පෙර නාමය :*

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී,
පෙර : මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්,
බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

....................................පැමිණිලිකරු.

*එදිරිව*

1. ෆැෂන් ටෙක්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
   අංක 154/2බී, හැව්ලොක් පාර,
   කොළඹ 05 සහ අංක 4. 1 වන මහල,
   කොලින්වුඩ් පෙදෙස, කොළඹ 06.

2. විජේරත්න පෝල් නිව්මන්,
   අංක 5/10, ශ්‍රමදාන මාවත,
   පාගොඩ පාර, නුගේගොඩ.

..................................විත්තිකරුවන්.

මෙම නඩුවෙහි වර්ෂ 2014 ක් වූ නොවැම්බර් මස 03 වෙනි දින ඇතුළත් කර ඇති සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි මෙම නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව රුපියල් හාර මිලියන අටලක්ෂ අසූපන්දහස් විසිහතයි ශත තිස්එකක (රු.4,885,027.31) මුදලක් හා රුපියල් හාර මිලියනය (රු.4,000,000) ක් වූ ඉතිරි ප්‍රාග්ධන මුදලක් මත වර්ෂ 2008 ක්වූ සැප්තැම්බර් මස 11 වන දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් වර්ෂයකට සියයට දහනවයක (19%) ක අනුප්‍රමාණයක් අනුව වූ පොලියක් ද සමග අයකර ගැනීමට නියෝග කර ඇති හෙයින් ද, එකී සමථ තීන්දු ප්‍රකාශයේ පළමුවන හා දෙවන උපලේඛනවල විස්තර කොට ඇති සම්පූර්ණ ඉඩම් කැබලි ඒ මත පිහිටි ගොඩනැගිලි ද එයට අයත් හෝ අනුබද්ධ සියලු අයිතිවාසිකම් ද එකී ඉඩම් විෂයයෙහි, එයින් හෝ මත පළමුවැනි හා දෙවන විත්තිකරුවන් සතු, සියලු ඉඩකඩම්, අයිතිවාසිකම්, හිමිකම් දේපළ හිමිකම් පෑම් හා ඉල්ලීම් ද සමග ප්‍රසිද්ධ නොතාරිස් එම්. අසංකා ඩී. සමරසිංහ විසින් ලියා අත්සන් කරන ලද අංක 569 හා වර්ෂ 2006 ක් වූ මැයි මස 11 වන දින දරන උකස් බැඳුම්කරය යටතේ හා ඒ ප්‍රකාරව ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා බැඳී ඇති බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවට සහ ඉහත කී මුදල් අයකර ගැනීම අරඹයා උකස් බැඳුම්කරය ක්‍රියාවෙහි යෙදවීමට පැමිණිලිකරු හිමිකම් ලබන බවට ප්‍රකාශ කර නියෝග කර ඇති හෙයින් ද,

ඉහත කී මුදල්, තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස දෙකක් (02) ක් ඇතුළත පැමිණිලිකරුට ගෙවන ලෙසට අධිකරණය විසින් විත්තිකරුවන්ට ආඥා කර ඇති හෙයින් ද, හා එසේ ගෙවීම විත්තිකරුවන් පැහැර හැර ඇති බැවින්, මෙහි පහත උපලේඛනවල විස්තර කොට ඇති එකී ඉඩම් හා පරිශ්‍රයන් මෙම අධිකරණයේ පිස්කල් මගින් විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියෝග කර ඇති හෙයින් ද, ඒ සඳහා මා පත්කොට සංස්ථාපනය කර ඇති හෙයින් ද, තීන්දු ප්‍රකාශයේ සඳහන් ආකාරයෙන් මුදල් හා නඩු ගාස්තු පැමිණිලිකරු වෙත අයකර දීම සඳහා එකී ඉඩම් දේපළ පිහිටි ස්ථානයේදීම 2016 අගෝස්තු මස 26 වැනි දින ප.ව. 3.00 ට මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තව ද, මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ ලංසු තබා දේපළ මිලදී ගන්නා ගැණුම්කරු වෙන්දේසියේ සම්පූර්ණ ගැණුම් මුදල හෝ එම මුදලින් 25% ක් ද, වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු එම වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු අතර, ඉතිරි 75% දින 30 ක් ඇතුළත මෙම අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

*දේපළට ප්‍රවේශ මාර්ගය* : කොළඹ සිට යන විට මොරටුව පානදුර පරණ පාරේ කඳුරුවත්ත හන්දියේ ගොරකාන සුසාන භූමිය අසලින් දකුණට හැරී කඳුරුදූව පාරේ මීටර් 350 ක් දුර යන විට වම්පසට හමුවන තිලක පාරෙන් හැරී මීටර් 400 ක් පමණ යනවිට දකුණුපස ඇති පාරෙන් හැරී මීටර් 100 ක් පමණ දුර ගමන් කිරීමෙන් පසු ඉඩමට ප්‍රවේශ විය හැකි ය.

### පළමුවන උපලේඛනය

(01) බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දිබ්බැද්දේ පානදුර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ (කෙසෙල් වත්ත උපකාර්යාලට අයත්) කඳුරුදූව ගමෙහි පිහිටි තිලක පාරේ වරිපනම් අංක 34 (කොටසක්) දරන කඳුරුගහඕවිට හා කුරුහෙරලියගහවත්ත නැමති දේපළට වරලත් මිනින්දෝරු කේ. ඩී. ජී.විරසිංහ මහතා විසින් වර්ෂ 1996.05.09 දින මැන සාදන ලද අංක 1027 නමැති පිඹුරේ කැබලි අංක 17 නැමති ඉඩමට මායිම්, උතුරට : කැබලි අංක 17, 18 හා 13 (පාරක් සඳහා වෙන්කල) නැගෙනහිරට : කැබලි අංක 13 (පාරක් සඳහා වෙන්කළ) සහ කැබලි අංක 16, දකුණට : කැබලි අංක 16, බස්නාහිරට : කැබලි අංක 21 ට මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 11.90) වූ ඉඩම සහ එයට අයත් සෑම සියලු දෙය ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 307/67 හි ලියාපදිංචි වී ඇත.

වරලත් මානක ඩබ්. ආර්. එම්. ප්‍රනාන්දු මහතාගේ වර්ෂ 2004.04.02 දිනැති සහ අංක 841 දරන පිඹුර ප්‍රකාරව කරන ලද නැවත මැනීමකට අනුව ඉහත ඉඩම මෙහි පහත දැක්වෙන පරිදි විස්තර වේ.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දිබ්බැද්දේ පානදුර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ (කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත්) කඳුරුදූව ගමෙහි පිහිටි තිලක පාරේ වරිපනම් අංක 34 (කොටසක්) දරන කඳුරුගහඕවිට හා කුරුහෙරලියගහවත්ත නැමති දේපළට වරලත් මානක ඩබ්. ආර්. එම්. ප්‍රනාන්දු මහතාගේ වර්ෂ 2004.04.02 දිනැති සහ අංක 841 දරන පිඹුරේ කැබලි අංක 17 A ට මායිම්, උතුරට : පිඹුරු අංක 1027 හි කැබලි අංක 18 හා 13 (පාර), නැගෙනහිරට : පිඹුරු අංක : 1027 හි කබැලි අංක 13 (පාර) සහ කැබලි අංක 16, දකුණට : පිඹුරු අංක 1027 හි කබැලි අංක 16, බස්නාහිරට : පිඹුරු අංක 1027 හි කබැලි අංක 21 (පානදුර ගඟ දිගේ රක්ෂිතය) ට මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 11.90) වූ ඉඩම වේ. තව ද පහතින් විස්තර කරන ලද ඉඩම් මතින් හා ඒ ඔස්සේ වන මාර්ග අයිතිය ද සමඟ වේ.

### දෙවන උපලේඛනය

(01) බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දිබ්බැද්දේ පානදුර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ (කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත්) කඳුරුදූව ගමෙහි පිහිටි කඳුරුගහඕවිට හා කුරුහෙරලියගහවත්ත නමැති දේපළට වරලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් වර්ෂ 1995.04.18 දින මැන සාදන ලද අංක 511 නැමති පිඹුරේ කැබලි අංක 2 (මීටර් 6 ක් පළල පාර) නැමැති ඉඩමට මායිම්, උතුරට : වරලත් මානක බී. එම්. එෆ්. කල්දේරා මහතාගේ 1906.02.12 දිනැති හා අංක 5397 දරන පිඹුරේ D කැබැල්ල සහ තිලක පාර, නැගෙනහිරට : වරලත් මානක එල්. එස්. එල් ද සිල්වා මහතාගේ අංක 8510 දරන පිඹුරේ කැබලි අංක 04 සහ කැබලි අංක 03, දකුණට : කැබලි අංක 03 සහ 04, බස්නාහිරට : කැබලි අංක 01, ට මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් දහහතරයි යි දශම පහයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.55) වූ ඉඩම සහ එයට අයත් සෑම සියලු දෙය ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 379/240 හි ලියාපදිංචි වී ඇත.

(02) බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දිබ්බැද්දේ පානදුර ප්‍රාදේශීය සභා බලසීමාව තුළ (කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත්) කඳුරුදූව ගමෙහි පිහිටි කඳුරුගහඕවිට හා කුරුහෙරලියගහවත්ත නමැති දේපළට වරලත් මිනින්දෝරු කේ. ඩී. ජී. පරසිංහ මහතා විසින් වර්ෂ 1996.05.09 දින මැන සාදන ලද අංක : 1027 නැමති පිඹුරේ කැබලි අංක : 13 නැමති (මීටර් 6 ක් පළල පාර) මායිම්, උතුරට : කැබලි අංක 23 (අඩි 6ක් පළල පාර) සහ කැබලි අංක 1, 6 සහ 7, නැගෙනහිරට : කබැලි අංක : 1, 6, 7 සහ 25 (අඩි 6 ක් පළල පාර), දකුණට : කැබලි අංක 11, 12, 14 සිට 20 දක්වා, බස්නාහිරට : කැබලි අංක 14 සිට 20 දක්වා ට මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දාහතයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 17.40) ක් වූ ඉඩම හා එයට අයත් සෑම සියලු දෙය ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 379/250 හි ලියාපදිංචි වී ඇත.

(03) බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දිබ්බැද්දේ පානදුර ප්‍රදේශීය සභා බල සීමාව තුළ (කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත්) කඳුරුදූව ගමෙහි පිහිටි කඳුරුගහඕවිට හා කුරුහෙරලියගහවත්ත නැමති දේපළට වරලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් වර්ෂ 1996.05.09 දින මැන සාදන ලද අංක 1027 නැමති පිඹුරේ කැබලි අංක 22 (මීටර් හතරයි දශම පහක් (4.5) පළල පාර ) නමැති මායිම් උතුරට : පිඹුරු අංක 511 හි කැබලි අංක 01, නැගෙනහිරට : කබැලි අංක 23, දකුණට : කැබලි අංක 20, බස්නාහිරට : කැබලි අංක 21 ට මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම හතරයි දෙක (අ. 0, රූ. 0, පර්. 5.42) ක් වූ ඉඩම සහ එයට අයත් සෑම සියලු දෙය ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 307/296 හි ලියා පදිංචි වී ඇත.

(04) බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දිබ්බැද්දේ පානදුර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ (කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත්) කඳුරුදූව ගමෙහි පිහිටි කඳුරුගහඕවිට හා කුරුහෙරලියගහවත්ත නමැති දේපළට

වරලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් වර්ෂ 1996.05.09 දින මැන සාදන ලද අංක 1027 නමැති පිඹුරේ කැබලි අංක 23 (මීටර් 6 ක් පළල පාර) නමැති මායිම්, උතුරට : වරලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් වර්ෂ 1995.04.18 දින මැන සාදන ලද අංක 511 නමැති පිඹුරේ කැබලි අංක 1, සහ 2, නැගෙනහිරට : ඉහත කී 511 පිඹුරේ කැබලි අංක : 03, දකුණට : කැබලි අංක : 24 (අඩි 6ක් පළල පාර) සහ කබැලි අංක 4, 3, 2, 1 සහ 13, බස්නාහිරට : කැබලි අංක 20 සහ 22 ට මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දාහතක් (අ. 0, රූ.0, පර්. 17) වූ ඉඩම සහ එයට අයත් සැම සියලු දෙය ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 379/231 හි ලියාපදිංචි වී ඇත.

(05) බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දිබ්බැද්දේ පානදුර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ (කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත්) කඳුරුදූව ගමෙහි පිහිටි කඳුරුගහඕවිට හා කුරුහෙරලියගහවත්ත නමැති දේපළට වරලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් වර්ෂ 1996.05.09 දින මැන සාදන ලද අංක 1027 නැමති පිඹුරේ කැබලි අංක 24 (මීටර් 6 ක් පළල පාර) නමැති ඉඩමට මායිම්, උතුරට : පිඹුරු අංක 511 හි කැබලි අංක 02, නැගෙනහිරට : පිඹුරු අංක 511 කැබලි අංක 03, දකුණට : පිඹුරු අංක 5397 හි ජී නමැති කැබැල්ල, බස්නාහිරට කැබලි අංක 10, 25, 9,5 සහ 4 ට මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහනවයයි දශම තුනයි හයක් (අ. 0, රූ. 0, පර්. 19.36) වූ ඉඩම සහ එයට අයත් සැම සියලු දෙය ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 379/246 හි ලියාපදිංචි වී ඇත.

(06) බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ පානදුර තල්පිටි දිබ්බැද්දේ පානදුර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ (කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත්) කඳුරුදූව ගමෙහි පිහිටි කඳුරුගහඕවිට හා කුරුහෙරලියගහවත්ත නමැති දේපළට වරලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් වර්ෂ 1996.05.09 දින මැන සාදන ලද අංක 1027 නමැති පිඹුරේ කැබලි අංක 25 (මීටර් 6 ක් පළල පාර) නමැති ඉඩමට මායිම්, උතුරට : කැබලි අංක 7, 8, 9, නැගෙනහිරට : කැබලි අංක 24, දකුණට : කැබලි අංක 10, සහ 11, බස්නාහිරට : කැබලි අංක 13 ට මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 7.35) වූ ඉඩම සහ එයට අයත් සැම සියලු දෙය ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 379/227 හි ලියාපදිංචි වී ඇත.

ප්‍රේමසිරි වඩුගේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමදාන විනිසුරු (මුළු දිවයිනටම),
වාණිජ මහාධිකරණය, කොළඹ 12.

2016 ජූලි මස 22 වෙනි දින,
කොළඹ 12, වාණිජ මහාධිකරණයේ දී ය.

08-194/1

---

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන සහ සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය.

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ්,
ෆයිනෑන්ස් පීඑල්සී,
බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

*නඩු අංකය :* CHC/113/2009/MR

*පෙර නාමය :*

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී,
ලංකා බැංකුව, මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල්ස් පාර, කොළඹ 03.

...................................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. ෆැෂන් ටෙක්ස් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම,
අංක 154/2බී, හැව්ලොක් පාර, කොළඹ 05, *සහ*
අංක 4, 1 වන මහල, කොලින්වුඩ් පෙදෙස, කොළඹ 06.

2. වල්තොට ආරච්චිගේ ෂර්මිලා ක්‍රිෂාන්ති විජයරත්න මිය,
විවාහට පෙර ද සිල්වා,
අංක 5/10, ශ්‍රමදාන මාවත,
පාගොඩ පාර, නුගේගොඩ.

.................................*විත්තිකරුවන්.*

*සහ දැන්*

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 86(2) වගන්තිය යටතේ ඉදිරිපත් කෙරෙන ඉල්ලීමක් පිළිබඳ කාරණාවේ දී ය.

1. ෆැෂන් ටෙක්ස් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම,
අංක 154/2බී, හැව්ලොක් පාර, කොළඹ 05, සහ
අංක 4, 1 වන මහල, කොලින්වුඩ් පෙදෙස, කොළඹ 06.

............................1 වන විත්තිකාර - *පෙත්සම්කරු.*

1. වල්තොට ආරච්චිගේ ෂර්මිලා ක්‍රිෂාන්ති විජයරත්න මිය,
විවාහයට පෙර ද සිල්වා,
අංක 5/10, ශ්‍රමදාන මාවත, පාගොඩ පාර, නුගේගොඩ.

...........................2 වන විත්තිකාර - *පෙත්සම්කරු.*

*-එදිරිව-*

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී,
ලංකා බැංකුව, මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල්ස් පාර, කොළඹ 03.

...................................පැමිණිලිකාර- *වගඋත්තරකරු.*

මෙම නඩුවෙහි වර්ෂ 2014 ක් වූ නොවැම්බර් මස 03 වැනි දින ඇතුලත් කර ඇති සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි මෙම නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව පළමුවන නඩු නිමිත්ත මත වර්ෂ 2008 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දිනට අයවිය යුතු රුපියල් දස මිලියන තුන්ලක්ෂ අසූදහස් හයසිය අසූතුනයි ශත දෙකක (රු. 10,380,683.02) සමස්ථ මුදලක් සමග එම මුදල සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කරන තුරු රුපියල් අට මිලියන පන් ලක්ෂයක (රු. 8,500,000) මුල් මුදල මත වර්ෂ 2008 සැප්තැම්බර් 11 දින සිට වර්ෂයකට 19% බැගින් වූ පොලිය සමඟ (එකී පොලිය වෙනුවෙන් රඳවාගෙන ඇති රුපියල් ලක්ෂයක (රු. 100,000) මුදල් උපාන්තය අඩුකිරීමෙන් පසුව) විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට නියෝග කර ඇති හෙයින් ද,

දෙවන නඩු නිමිත්ත මත වර්ෂ 2008 ක් වූ සැප්තැම්ර් මස 10 වැනි දිනට අයවිය යුතු වන රුපියල් හාර මිලියන දෙලක්ෂ හැත්තෑ හතර දහස් තුන්සිය අනූඅටයි ශත අනූවක (රු. 4,274,398.90) මුදල සහ එම මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තුරු මුල් මුදල වන රුපියල් තුන් මිලියන පන් ලක්ෂයක (රු. 3,500,000) මුදල මත සියයට දහනවයක් (19%) බැගින් වූ පොලියක් සමග විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට නියෝග කර ඇති හෙයින් ද,

එකී සමථ තීන්දු ප්‍රකාශයෙහි පළමුවන හා තුන්වන උපලේඛනයන් හි විස්තර කොට ඇති සම්පූර්ණ ඉඩම් කැබලි ඒ මත පිහිටි ගොඩනැගිලි ද එයට අයත් හෝ අනුබද්ධ සියලු අයිතිවාසිකම් ද, එකී ඉඩම් විෂයයෙහි එයින් හෝ ඒ මත පළමුවන හා දෙවන විත්තිකරුවන් සතු සියලු ඉඩකඩම්, අයිතිවාසිකම්, හිමිකම්, දේපල හිමිකම් පෑම හා ඉල්ලීම් ද සමඟ මින්මතු දෙවන හා හතරවන උපලේඛනයන් හි දක්වා ඇති ඉඩම් මගින් වූ මාර්ග අයිතිය සහ ඊට අදාල හා ආනුශාංගික වූ පරවශතා අයිතීන්ද සමග ප්‍රසිද්ධ නොතාරිස් එම්. අසංකා ඩී සමරසිංහ විසින් ලියා අත්සන් කරන ලද අංක 567 හා 568 දරන වර්ෂ 2006 ක් වූ මැයි මස 11 වැනි දින දරන උකස් බැඳුම්කරයන් යටතේ හා ඒ ප්‍රකාරව ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා බැඳී ඇති බවට හා ක්‍රියාවේ යෙදවිය යුතු බවට සහ ඉහත කී මුදල් අයකර ගැනීම අරභයා එම උකස් බැඳුම්කරයන් යුගලය ක්‍රියාවෙහි යෙදවීමට පැමිණිලිකරු හිමිකම් ලබන බවට නියෝග කර ඇති හෙයින් ද,

ඉහත කී මුදල් තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස දෙකක් (02) ඇතුළත පැමිණිලිකරුට ගෙවිය යුතු බවට හා එසේ ගෙවීම පැහැර හැර ඇති බැවින්, මෙහි පහත උපලේඛනවල විස්තර කොට ඇති එකී ඉඩම් හා පරිශ්‍රයන් අධිකරණයේ පිස්කල් මගින් විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට, වැඩිදුරටත් ආඥා කර ඇති හෙයින් ද,

එකී වෙන්දේසිය, පැවැත්වීම ගරු අධිකරණය විසින් මා පත්කොට සංස්ථාපනය කර ඇති හෙයින් පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් දේපල, ඒවා පිහිටි ස්ථානයේදී ම, 2016 අගෝස්තු මස 29 වැනි දින ප.ව. 3.00 ට මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තව ද, මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ ලංසු තබා දේපල මිළදී ගන්නා ගැණුම්කරු වෙන්දේසියේ සම්පූර්ණ ගැණුම් මුදල හෝ එම මුදලින් 25% ක් ද, වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු එම වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු අතර,ඉතිරි 75% දින 30 ක් ඇතුළත මෙම අධිකරණයේ තැන්පත් කළ යුතුය.

*දේපලට ප්‍රවේශ මාර්ගය* :- තලවතුගොඩ සිට පන්නිපිටිය දෙසට දිවෙන බස් පාරේ කළල්ගොඩ හන්දිය අසල 5 වන කිලෝමීටර් කණුව අසලින් වමට හැරී කළල්ගොඩ පාරේ මීටර් 1600 ක් පමණ යනවිට (වීර මාවත හන්දියට පෙර) නැවත වමට හැරී මවුන්ට් ටෙරස් පාරේ මීටර් 150 ක් පමණ යනවිට අංක 65/8 දරන ස්ථානයේ මෙම දේපල පිහිටා ඇත.

## උපලේඛනය

(01) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කලල්ගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සකසන ලද අංක 2088 සහ 1986 ජනවාරි 11 වන දිනැති පිඹුර දොලේලන්ද නමැති ඉඩමෙන් කැබලි අංක 06 වශයෙන් දක්වා ඇති බෙදා වෙන්කල ඉඩම් කොටස සමග ඒ මත පිහිටි ගොඩනැගිල්ල, එකී 6 වන බිම් කට්ටියට මායිම් උතුරට : පලිහදේරු ආරච්චිගේ රූපසිංහ සහ තවත් අයගේ ඕවිට, නැගෙනහිරට : එකී අංක 2088 දරන පිඹුරේ 28 දරන බිම් කට්ටිය, දකුණට : එකී අංක 2088 දරන පිඹුරේ 27 දරන බිම් කට්ටිය (අඩි 20 ක් පළල පාරකට වෙන් කල කොටස) සහ බස්නාහිරට : එගොඩගේ ඩේවිඩ් පෙරේරාට අයත් දේපල යන එකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2088 දරන පිඹුර අනුව පර්චස් දහසයයි දශම දෙකයි පහක (අ. 0, රූ.0, පර්. 16.25) හෙක්ටයාර් 0.041099 හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් අංක. G 633/229 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

තව ද, පහත විස්තර කර ඇති පරිදි මාර්ග සඳහා වෙන් කිරීම් සහ ඒවා මත යාම් ඊම් මාර්ග අයිතිය සහ අනෙකුත් සියලුම හිමිකම් සමඟ ය.

(02) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කලල්ගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. කපුගීකියන විසින් සකසන ලද අංක 2088 සහ 1986 ජනවාරි 11 වන දිනැති පිඹුරේ දොලේලන්ද නමැති ඉඩමෙන් කැබලි අංක 27 දක්වා ඇති බෙදා වෙන්කළ (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කළ) ඉඩම් කොටස එකී 27 වන බිම් කට්ටියට මායිම්, උතුරට : එකී අංක 2088 දරන පිඹුරේ 6, 7, 8 සහ 9 දරන බිම් කට්ටි, නැගෙනහිරට, එකී අංක 2088 දරන පිඹුරේ 19-22 දක්වා සහ 24 සහ කැබලි අංක 10-14 දක්වා සහ 26 කැබැල්ල දරන බිම් කට්ටි, දකුණට : එකී අංක 2088 දරන පිඹුරේ 18, 19 බිම් කට්ටි සහ පාර, බස්නාහිරට : එකී අංක 2088 දරන පිඹුරේ 23 බිම් කට්ටිය, එම පිඹුරේම 1 සිට 5 දක්වා වූ බිම් කට්ටි, 18, 17,16, 15, සහ 25 යන එකී මායිම් තුළ ඉහත කී අංක 2088 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් පහළොවක (අ. 0, රූ. 1, පර්. 15.0) හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් අංක G 633/246 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

ප්‍රේමසිරි වඩුගේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමදාන විනිසුරු (මුළු දිවයිනටම),
වාණිජ මහාධිකරණය, කොළඹ 12.

2016 ජූලි මස 22 වැනි දින,
කොළඹ 12, වාණිජ මහාධිකරණයේ දී ය.

08-194/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල්ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **අගෝස්තු** | 2016.08.05 | සිකුරාදා | 2016.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.12 | සිකුරාදා | 2016.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.19 | සිකුරාදා | 2016.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.08.26 | සිකුරාදා | 2016.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2016.09.02 | සිකුරාදා | 2016.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.09 | සිකුරාදා | 2016.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.15 | බ්‍රහස්පතින්දා | 2016.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.23 | සිකුරාදා | 2016.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.09.30 | සිකුරාදා | 2016.09.15 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2016.10.07 | සිකුරාදා | 2016.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.14 | සිකුරාදා | 2016.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.21 | සිකුරාදා | 2016.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.28 | සිකුරාදා | 2016.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2016 ජූනි මස 21 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.